# 5 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 08

(Part i)

**L6 S6 R6 W6**

**නිපුණතා ආවරණය - 2021**



1. යමෙකු කරන කතාවකට අවධානයෙන් හා ඉවසීමෙන් යුතු ව සවන් දෙයි.
2. සුහදව හා සංයමයෙන් යුතු ව තම අදහස් පළ කරයි.
3. කණ්ඩායමක් සම!ග එක් ව සාකච්ඡා කරමින් අදහස් හුවමාරු කර ගනියි.
4. සුබ පැතුම් පත් නිර්මාණශීලීව සකස් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
5. තොරතුරුවල සුවිශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් ඒවා නිවැරදි ව වගුගත කරයි.
6. පෞද්ගලික ලිපියක සුවිශේෂතා කෙරෙහි සැලකිලිමත්ව ලිපි ලියයි.
7. ආරාධනා පත්‍රයක ඇතුළත් වියයුතු සුවිශේෂතා කෙරෙහි සැලකිලිමත් වෙයි.
8. ආරාධනා පත්‍රයක් සකස් කර ඉදිරිපත් කරයි.
9. ආකෘති පත්‍රයක් නිවැරදි ව සම්පූර්ණ කරයි.
10. යම් අදහසක් කාටූන් මගින් නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි.


**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



For Online Class Details – WhatsApp 071 9020298

# 5 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_6$ $S_6$ $R_6$ $W_6$ ඉගෙනුම් පල

- යමෙකු කරන කතාවකට අවධානයෙන් හා ඉවසීමෙන් යුතු ව සවන් දෙයි.
- සුහදව හා සංයමයෙන් යුතු ව තම අදහස් පළ කරයි.
- කණ්ඩායමක් සමග එක් ව සාකච්ඡා කරමින් අදහස් හුවමාරු කර ගනියි.
- සුබ පැතුම් පත් නිර්මාණශීලී ව සකස් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- තොරතුරුවල සුවිශේෂතා කෙරෙහි අවධානය යොමු කර නිවැරදි ව වගුගත කරයි.
- පෞද්ගලික ලිපියක සුවිශේෂතා කෙරෙහි සැලකිලිමත් ව ලිපි ලියයි.
- ආරාධනා පත්‍රයක ඇතුළත් විය යුතු සුවිශේෂතා කෙරෙහි සැලකිලිමත් වෙයි.
- ආරාධනා පත්‍රයක් සකස් කර ඉදිරිපත් කරයි.
- ආකෘති පත්‍රයක් නිවැරදි ව සම්පූර්ණ කරයි.
- යම් අදහසක් කාටූන් ම!ගින් නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි.

## සන්නිවේදනය

- සාහිත්‍යය ඇසුරු කිරීමෙන් වන ප්‍රයෝජන
  1. විවේකය ඵලදායී ව ගත කිරීමට ලැබීම
  2. සිත සැහැල්ලු වීම
  3. නිර්මාණශීලී අදහස් ඇති වීම
  4. සිත සතුටට පත් වීම
  5. විවිධ අත්දැකීම් ලැබීමට හැකි වීම
  6. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
- විශේෂිත පුද්ගලයන් සමග සන්නිවේදනය සඳහා තෝරා ගත හැකි පුද්ගලයන්
  1. තම පාසලේ මූලික අධ්‍යාපනය ලබා වර්තමානයේ උසස් රැකියාවක නිරත වන්නෙක්
  2. ස්වෝත්සාහයෙන් ජයගත් පුද්ගලයෙක්
  3. නිර්මාණශීලී නිපැයුම්වල යෙදී ප්‍රසිද්ධ වූ අයෙක්
  4. ගැටලුවලට මුහුණ දී ජය ගත් අයෙක්
  5. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
- කුඩා කණ්ඩායම් සමග සන්නිවේදනය සඳහා දෙන ලද ප්‍රස්තුතය/තේමාව පිළිබඳ ව යහළුවන් සමග කතා කරන්න.
  1. අලුත් අවුරුදු කාලය
  2. සහභාගි වූ විනෝද ගමනක්
  3. කැමති සතෙක්
  4. කැමති ක්‍රීඩාවක්
  5. කෙනෙකුට පිහිට වූ අවස්ථාවක්
  6. . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . .. . . . .

## සුබ පැතුම් පත්

- සුබ පැතුම් පතක් ලිවීමේ දී අඩංගු විය යුතු කරුණු

1. සුබ පැතුම් පත කුමක් සඳහා ද ?
2. එය ලියා ඇත්තේ කවරෙක් ද ?
3. කවුරුන් සඳහා ද ?
4. සුබ පැතුමෙහි විස්තරය

උදා : විවිධ තරගවලින් (චිත්‍ර, නැටුම්, ගායනා, කථික, ක්‍රීඩා, . . .) ජය ගත් විට

සුබ පැතුම්



සාහිත්‍ය මාසය වෙනුවෙන් පැවති
'පොත් කියවීමේ' තරගයෙන්
වැඩි ම පොත් ගණනක් කියවා
ජයග්‍රහණය හිමි කර ගත්

. . . . . . . . . . . . . . . . . . . . . . .

සොහොයුරා/සොහොයුරියට
තව තවත් පොත් කියවා
ජීවිතය ජය ගන්නට
සුබ පැතුම් !

. . . . . . . . . . . . . . . . .
සොහොයුරා/සොහොයුරිය

1. සුබ පැතුම් පත කුමක් සඳහා ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. එය ලියා ඇත්තේ කවරෙක් ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. කවුරුන් සඳහා ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. සුබ පැතුම් පත් නිර්මාණය කළ හැකි වෙනත් අවස්ථා මොනවා ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## වගුගත කිරීම්

- දී ඇති වගු සම්පූර්ණ කර ද්‍රව්‍ය වර්ග කරන්න.

| එළවළු | පලතුරු | පලා වර්ග |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

| කුරුල්ලන් | සිවුපා සතුන් | මත්ස්‍යයන් |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| ස්ත්‍රී ලිංග නාම පද | පුරුෂ ලිංග නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| පුද්ගල නාම පද | සත්ත්ව නාම පද | ස්ථාන නාම පද | ද්‍රව්‍ය නාම පද |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

# පෞද්ගලික ලිපි

- පෞද්ගලික ලිපියක ආකෘතිය

1. ලිපියේ දකුණු පසින් ලිපිය ලියන ස්ථානයත්, දිනයත් සඳහන් කරන්න.
2. එහි දී ස්ථානය ලියූ තැන අගට කොමාව යොදන්න.
3. පෞද්ගලික ලිපියක් ලිවීමේ දී ලිපිය යවන්නාට ආශිර්වාද කිරීමට සුදුසු ආශිර්වාද වදනක් ලියන්න. උදාහරණ - සැප වේවා.
4. ආශිර්වාදය ලියා අවසානයේ දී හර්ෂාදි ලකුණ යොදන්න.
5. ඥාතීන්ට ලිපියක් ලිවීමේ දී ආමන්ත්‍රණය සඳහා ආදරණීය/සදාදරණීය/දයාබර වැනි වදන් යොදන්න. මිතුරෙකුට හෝ වෙනත් හිතවතෙකුට හෝ ලිවීමේ දී මා හිතවත් යනුවෙන් ලියා මිතුරාගේ /මිතුරියගේ නම සඳහන් කරන්න.ආමන්ත්‍රණය ලියා අවසානයේ කොමාව යොදන්න.

ස්ථානය
දිනය

ආශීර්වාදය

ආමන්ත්‍රණය

කරුණු . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

අවසානය

6. කරුණු ලිවීමේ අවස්ථාවේ දී ආමන්ත්‍රණයට යටින් ඇති රූලේ කුඩා ඉඩ ප්‍රමාණයක් හැර ලිවීම ආරම්භ කරන්න.
7. එහි දී ඥාතියාගේ/ මිතුරාගේ/මිතුරියගේ/ සහෝදරයාගේ/සහෝදරියගේ සුවදුක් විමසීමත්, තමා ඇතුළු පවුලේ අය සුවෙන් සිටින බවත් ලියන්න.
8. ලිවිය යුතු කරුණු පේළි හයක්/අටක් වැනි ප්‍රමාණයකින් ලියන්න.
9. කරුණු ලියා අවසානයේ දී ද සෙත් පැතීම සඳහා වාක්‍යයක් ලියන්න. සෙත් පැතීම තමාගේ ආගමට අනුව තෙරුවන් සරණ යි/ජේසු පිහිට යි/දෙවි රැකවරණ යි . . . ආදි ලෙසින් කළ හැකි ය.
10. ලිපිය ලියා අවසන් කරන විට ලිපිය ලියූ තැනැත්තා කවරෙක් ද යන්නත් නමත් සඳහන් කරන්න. නමට ඉහළින් ඇති වචනයේ අගට කොමාව යොදන්න.

නිවසේ දී,
2020.08.08

සැප වේවා !

මා ආදරණීය ආච්චි අම්මා වෙත,

ආච්චි අම්මා සනීපයෙන් ඉන්නවා නේද ? ලොකු අම්මාත් සුවෙන් ඇතැයි සිතනවා. චාමර අයියාත් චලනි අක්කාත් පාසල් යනවා ද ? අපි සැම දෙනාත් සුවෙන් සිටිනවා.

තාත්තාට නිවාඩුවක් ලද විගස ම ආච්චි අම්මා බලන්නට එන බව අම්මා කිවුවා. මම ඒ ගැන තාත්තාගෙන් ඇසුවා. ලබන සති අන්තයේ ගමේ යන බව තාත්තා කිවුවා.

මේ ලිපිය ලියන්නේ ආච්චි අම්මාට ඒ බව දැනුම් දීමට යි. අපි ලබන සති අන්තයේ ගමේ එන බව ලොකු අම්මාටත් කියන්න. ආච්චි අම්මා ඇතුළු පවුලේ සැමට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා.

ආදරණීය
පොඩි පුතා,
හසිත

- පහත සඳහන් එක් අවස්ථාවක් යටතේ පෞද්ගලික ලිපියක් ලියන්න.

    1. පාසලේ පැවැත්වූ අත් අකුරු තරගයෙන් ඔබ ජයග්‍රහණය කළ බව දන්වා ඔබේ මිතුරෙකුට/මිතුරියකට යවන ලිපියක්
    2. සීයාගේ/ආච්චි අම්මාගේ සුව දුක් විමසමින් ඔබ නිවසේ විස්තර ද දන්වමින් යවන ලිපියක්
    3. නිවාඩුවට ඔබේ නිවසට එන බව දන්වා ඔබගේ හොඳ ම මිතුරාට/ මිතුරියට යවන ලිපියක්
    4. ඔබට ඔබ සිටි පාසලෙන් වෙනත් පාසලකට යෑමට සිදු විය. එම අලුත් පාසල් පරිසරය පිළිබඳ ව දන්වමින් තමාගේ හොඳ ම මිතුරාට/මිතුරියට යවන ලිපියක්